**මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම - 2017**

----------------------------------------------------------------------------

මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

----------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

-----------------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------------

(අ) තොග සත්‍යාපන වාර්තා විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු. 12,375,228 ක් වූ ඉන්ධන තොගය, අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් තොගය, කඩන ලද කුඩා ගල් තොගය සහ ගිනි නිවීමේදී භාවිතා කරන ද්‍රව්‍ය තොගය යනාදියෙහි පැවැත්ම,විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 29,975,094 ක වටිනාකමින් යුත් ගෙවීම් 104 කට සහ රු. 1,713,484 ක් වූ වියදම්වලට අදාල ගෙවීම් වවුචර් හා අනෙකුත් උපකාරක ලියවිලි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම වියදම් විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඇ) සමාගම විසින් 2014 වර්ෂය තුලදී පුද්ගලික වාණිජ බැංකුවකින් එක්සත් ජනපද ඩොලර් 24,002,438 ක් වූ ණය 4 ක් ලබා ගෙන තිබුණි. එම ණය ශේෂයේ එක්සත් ජනපද ඩොලර් 5,175,774 ක් 2015 හා 2016 වර්ෂයන් තුල දී පියවා තිබූ නමුත් ඉන්පසුව සමාගම විසින් ණය ආපසු ගෙවීම නතර කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවති ණය ශේෂය හා පොළිය පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 18,826,664 (රු. 2,884,810,689) ක් හා එක්සත් ජනපද ඩොලර් 1,737,696 (රු. 266,267,314 ) ක් විය.

(ඈ) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට, බැංකු ප්‍රකාශනය තුල අන්තර්ගතව පැවති රු.2,567,188 ක් වූ හඳුනා නොගත් බැර ශේෂය නිශ්චිතව හඳුනා ගෙන ගිණුම්ගත කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**කරුණු අවධාරණය**

-------------------------

මාගේ මතය තත්ත්වාගණනය කිරීම සඳහා හේතු වන කරුණක් ලෙස නොසලකා, සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාල කරගත් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනයක් විස්තර කරන මූල්‍ය ප්‍රකාශන සටහන් 23 කෙරෙහි අවධානය යොමු කරවමි.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව, මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) විගණන මතය සඳහා පදනම සහ විගණනයේ විෂය පථය සහ සීමා කාලය ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර,

- විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගත් බවත් මාගේ පරීක්ෂණ වලින් පෙනීයන අන්දමට, සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් ඇති බවත්,
- සමාගමේ මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

**2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

-------------------------------------------

2017 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලට අදාල ජ'නල් සටහන් වල නිවැරදි බව පරීක්ෂා කිරීම සඳහා ජ'නල් වවුචර හා උපකාරක ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ලෙස රු.2,985,798 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද සමාගමේ 2017/2018 තකේස්රු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමේදී ඉහත මුදල අඩු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනට ද ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ලෙස රු.2,667,432 ක් වූ බදු ශේෂයක් ගිණුම් තුල දක්වා තිබුණද අදාල රඳවා ගැනීම් බදු සහතිකපත් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. ඒ හේතුවෙන් ඉහත රඳවා ගැනීමේ බදු මුදල ආදායම් බදු ගණනයේදී අඩු කර ගැනීම පිළිබඳව අවිනිශ්චිත තත්ත්වයක් පැවතුණි.

(ආ) 2014 ජූනි 22 දින හම්බන්තොට වරායට පැමිණි නෞකාවක් වෙත එක්සත් ජනපද ඩොලර් 63,500 ක් වූ (IFO) 380 ඉන්ධන මෙට්‍රික් ටොන් 102.42 ක් විකුණා තිබූ අතර අදාල නියෝජිත ආයතනය විසින් එම ඉන්ධන සඳහා වූ මුදලින් එක්සත් ජනපද ඩොලර් 47,870 ක් සමාගම වෙත ගෙවා තිබුණි. නමුත් ඉතිරි මුදල වූ එක්සත් ජනපද ඩොලර් 15,630 කට සමාන රු. 2,396,079 ක මුදල 2017 දෙසැම්බර් 31 දින වන විටත් සමාගම වෙත අය නොවී පැවතුණි. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් ඉහත සම්පූර්ණ ණය ශේෂය සඳහා අඩමාන ණය වෙන් කිරීම් කර තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට 2016/2017 තක්සේරු වර්ෂයට අදාලව ගෙවිය යුතු ආදායම් බදු රු.4,187,009 ක් වී තිබුණි. කෙසේ වුවද එම මුදල ගෙවූ බව සනාථ කෙරෙන ලියවිලි 2018 නොවැම්බර් 05 දින දක්වාම විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

**2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම්**

-----------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | |
| (i) 5.1.1 වගන්තිය | වසර 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් (Corporate Plan) පිළියෙල කළයුතු වුවත් සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) 7.2 වගන්තිය | ආයතනයේ පාලන පරිසරයේ ප්‍රධාන අංගයක් ලෙස සියලු ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන පරිදි සකස් කරන ලද මෙහෙයුම් අත්පොතක් (Procedure Manual) පිළියෙල කළ යුතු වුවත් සමාගම එවැනි මෙහෙයුම් අත්පොතක් සකස් කර නොතිබුණි. |
| (iii) 7.4.1 වගන්තිය | විගණන කමිටුව රැස් වී අභ්‍යන්තර විගණනයෙන් සොයාගත් කරුණු මත පදනම්ව ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීමට අදාල නිර්දේශ ලබාදිය යුතු වුවත්, සමාගමේ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර විගණන කමිටු රැස්වීම් ද පවත්වා නොතිබුණි. |
| (iv) 9.3.1 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින් සෑම තනතුරක් සඳහාම විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් (Schemes of Recruitment) සකසා ඊට රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගත යුතු වුවත්, සමාගම විසින් එවැනි බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඊට අදාල පාර්ශවයන්ගේ අනුමැතීන් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (v) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛයේ 02 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්මට අනුගතව ක්‍රියාකාරී සැලැස්මක් (Action Plan) පිළියෙල කළයුතු වුවත් සමාගම විසින් එම සැලැස්ම පිළියෙල කර නොතිබුණි. |
| (ආ) 2011 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2011 | රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල විශ්‍රාමික නිලධාරියෙකු වයස අවුරුදු 60 ඉක්මවා සේවයේ යෙදවීමට අවශ්‍ය වූ විට මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ක්‍රියාකළ යුතුය. එසේ වුවද මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ නිලධාරීන් 08 දෙනෙකු ඉහත අවශ්‍යතාවය සම්පූර්ණ නොකර සේවයේ යොදවාගෙන තිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

---------------------------

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 109 ක අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු. මිලියන 534 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 425 කින් හෙවත් සියයට 80 කින් වර්ධනය වී තිබුණි.ඉකුත් වර්ෂයේදී තොගවල ශුද්ධ උපලබ්ධි අගය රු. 585,496,943 ක් ගිණුම්ගත කිරීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ අලාභය ඉහළ අගයක් ගෙන තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------------

4.1 **කාර්යසාධනය**

---------------------

පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාගම පිහිටුවා තිබූ නමුත්.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමාගම වෙත කලින් කලට පවරනු ලබන රාජකාරී හා කාර්යයන් ඉටු කිරීමත්, මාගම්පුර වරාය කළමනාකරණ හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම,

නවීන ජාත්‍යන්තර මුහුදු වරායක් ලෙස හම්බන්තොට මහින්ද රාජපක්ෂ වරාය සංවර්ධනය කිරීම,

හම්බන්තොට මහින්ද රාජපක්ෂ වරාය සීමාව තුල කාර්මික කලාපයක් ඇති කිරීම,

නාවික යාත්‍රා වලට නැව් තෙල්, ජලය සහ අනිකුත් සේවා සැපයීම,

අරමුණු වලින් සමාගම පිහිටුවා තිබූ නමුත් එම අරමුණු අතුරින් වරාය අධිකාරිය මඟින් පවරනු ලබන රාජකාරි හා කාර්යයන් ඉටු කිරීම හා මාගම්පුර වරාය කළමනාකරණ මෙහෙයුම් කටයුතු සිදු කිරීම පමණක් ඉටුකර තිබූ අතර ඉතිරි අරමුණු සාර්ථකව හා ප්‍රමාණවත් ලෙස ඉටු කිරීමට සමාගමට නොහැකි වී තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සෘජුවම සාංගමික සංස්ථා පත්‍රයේ අරමුණක් ලෙස දක්වා නොතිබියදී 2015 වර්ෂයේ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි නිෂ්පාදනය සිදුකර තිබුණි.එයින් චයිනා හාබර් ඉංජිනේරු (China Harbor Engineering) සමාගම වෙත සමාගම විසින් රු.25,166,000 ක මුදලකට අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි (Inter Lock) 506,000 ක් ලබාදී තිබුණි. මෙම අන්තර් සම්බන්ධිත කුට්ටි නියම ගුණාත්මකභාවයෙන් යුක්ත නොවූ හෙයින් එම කැටවලින් කොටසක් ආපසු එවා තිබුණු අතර China Harbor Engineering සමාගම වෙත රු.3,660,000 ක මුදලක් සමාගම විසින් 2017 වර්ෂය තුලදී ආපසු ගෙවා තිබුණි. නිසි ප්‍රමිතියකින් තොරව මෙම නිෂ්පාදන සිදු කිරීම නිසා මෙම තත්ත්වය උද්ගතව තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සමාගම විසින් සමාගමේ නිලධාරීන් විසි දෙදෙනකු සඳහා පිරිවැය රු.436,541 ක් වූ ජංගම දුරකථන 22 ක් භාවිතය සඳහා ලබා දී තිබූ අතර 2018 ජනවාරි 30 දින සමාගමේ සේවකයින් ඉවත් කිරීමේ දී එම දුරකථන ආපසු ලබා ගැනීමට කළමනාකරණය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විගණන දිනය වූ 2018 ජූලි 15 දින වන විට නිලධාරීන් 16 දෙනෙකුට ජංගම දුරකථන ආපසු භාරදෙන ලෙස දැනුම්දී තිබූ නමුත් එක් දුරකථනයක් පමණක් ආපසු භාරදී තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට අයිඑෆ්ඕ 380 (IFO 380) හා එම්ජීඕ (MGO) යන තෙල් වර්ග දෙකෙහි පොත්වල දැක්වෙන තොග ශේෂය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 35 ක් හා මෙට්‍රික් ටොන් 1,083 ක් විය. සමාගමේ නැව් තෙල් අලෙවිය ඇතුලු මෙහෙයුම් කටයුතු අවසන් කර තිබුණද ඉහත තොගය පිළිබඳව අවසන් තීරණයක් ගැනීමට විගණිත දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී ස්ථාවර තැන්පතු මත වර්ෂය තුල ලද රු. 44,097,112 ක පොළී ආදායම ආයෝජන ක්‍රියාකාරකම්වලින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස දැක්විය යුතු වුවද එම මුදල මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. තවද සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී රේගුව විසින් රාජසන්තක කරන ලද නැව් තෙල් තොගයේ වටිනාකම වූ රු. 35,563,498 ක් බදු පෙර අලාභයට ගැලපිය යුතු වුවත් එය කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් යටතේ තොග වෙනස්වීමක් ලෙස දක්වා තිබුණි.

(ඉ) ආදායම් බදු ගෙවීම් රු. 464,282 ක් ආදායම් බදු ගිණුමට හර කිරීම වෙනුවට ගෙවිය යුතු සේවක අර්ථ සාධක සහ සේවක භාරකාර අරමුදල් ගිණුමට හර කිරීම හේතුවෙන් එම වටිනාකමින් ගෙවිය යුතු ආදායම් බදු ගිණුම අධිගණනය වී සේවක අර්ථ සාධක හා භාරකාර අරමුදල් ගිණුම ඌණගණනය වී තිබුණි.

(ඊ) සමාගම විසින් කුලී පදනම මත ලබා ගන්නා ලද නිවසක් ආපසු ලබාදීමේදී ආපසු අයකරගත යුතු වූ රු. 100,000 ක අත්තිකාරම් මුදල අයකර නොතිබුණු අතර එය නවාතැන් වියදම් ලෙස කපා හැර තිබුණි.

**4.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් 2017 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුල රු. 67,091,908 ක් අතිකාල ලෙස ගෙවා තිබුණි. වරාය මෙහෙයුම් කටයුතු අවම තත්ත්වයක පැවතියද වරායේ මෙහෙයුම් නොවන අංශවල සේවකයින්ට රු.මිලියන 31.7 ක් ද මෙහෙයුම් කටයුතු නවතා දමා තිබූ තෙල් ටැංකි මෙහෙයුම් අංශයේ සේවකයින් වෙත රු.මිලියන 3.7 ක් ද මෙහෙයුම් අංශය සඳහා රු.මිලියන 17 ක් වූ අතිකාල දීමනාද ගෙවා තිබුණි. මේ නිසා අතිකාල සේවයේ යෙදවීමේ අවශ්‍යතා පිළිබඳ නොසලකා අතිකාල අනුමත කිරීමට හා ගෙවීමට කළමනාකරණය විසින් අපරීක්ෂාකාරී ලෙස කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. තවද මෙම අතිකාල ගෙවීම්වලට අදාල කළ වැඩ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(ආ) මාගම්පුර වරාය කළමනාකරණ පෞද්ගලික සමාගමේ සේවය කරන සියළුම කාර්ය මණ්ඩලය විසින් රාජකාරී කටයුතු සඳහා වාර්තා කල බව තහවුරු කිරීම සඳහා ඇඟිලි සලකුනු යන්ත්‍රයේ තම ඇඟිලි සටහන් තැබීම අනිවාර්ය කර තිබූ නමුත් ඉහළ කළමනාකරණයේ නිලධාරීන් 3 දෙනෙකු රාජකාරියට වාර්තා කිරීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර පැමිණීම පිටවීම සටහන් කර නොතිබුණි.

(ඇ) සමාගමේ මූල්‍ය උපදේශන සේවා සැපයීම සඳහා 2016 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව සහකාර සාමාන්‍යාධිකාරි ලෙස සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු 2015 ඔක්තෝබර් 15 දින සිට බලපැවැත්වෙන පරිදි රු.50,000 ක දීමනාවක් මත 2015 නොවැම්බර් 01 දින සිට පත්කර තිබුණි. අදාල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව අනුව එම තනතුරට සුදුසු අයකු පත්කර ගන්නා තෙක් අදාල පත්වීම සිදුකර තිබුණද 2017 දෙසැම්බර් එම තනතුරට සමාගමේ මෙහෙයුම් කටයුතු අවසන් කරන තෙක් සුදුසු නිලධාරියකු පත්කර නොතිබුණි. කෙසේ වුවද 2017 වර්ෂයේ දී අදාල උපදේශකවරයාට වාර හයක දී රු. 287,167 ක් ගෙවා තිබූ නමුත් ඉදිරිපත් කරන ලද උපදේශන වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(ඈ) සමාගම සඳහා නිලධාරීන් බඳවා ගැනීමේදී සමාගමේ අනුමත මානව සම්පත් සැලැස්මේ ඇතුලත් තනතුරුවලට අයත් වැටුප් කාණ්ඩයට අදාල මූලික වැටුප පදනම් කරගෙන පත්කිරීම් සිදු කළ යුතු වුවත් ඊට වඩා වැඩි වැටුපකට නිලධාරීන් බඳවාගෙන තිබූ බව නිලධාරීන්ගේ පත්වීමේ ලිපි පරීක්‍ෂා කිරීමේදී අනාවරණය විය. නියැදි විගණන පරීක්ෂණයට අනුව තනතුරු 2 කට බඳවා ගෙන තිබූ නිලධාරීන් 10 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වා මානව සම්පත් සැලැස්මට පටහැනිව රු. 6,795,000 ක් වැඩි පුර ගෙවා තිබුණි. එසේම මෙම පත් කිරීම් සහ වැටුප් මට්ටම තීරණය කිරීම සඳහා අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

## 4.4 කාර්යමණ්ඩල පරිපාලනය

---------------------------------------

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) මාගම්පුර වරාය කළමනාකරණ සේවා සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 දෙසැම්බර් 13 දින සිට හම්බනේතාට ජාත්‍යන්තර වරාය සමූහ (පුද්ගලික) සමාගම (HIPG) සහ හම්බන්තොට ජාත්‍යන්තර වරාය සේවා (පුද්ගලික) සමාගම (HIPG) වෙත පවරා තිබුණි. සමාගම සතුව පැවති ඉතිරි නැව් තෙල් තොගද 2017 නොවැම්බර් 27 දින විකුණා තිබුණි. මෙවැනි තත්ත්වයන් තුල මාගම්පුර වරාය කළමනාකරණ සේවා සමාගමේ සේවය කර වන්දි මුදල් ලබාගෙන ඉවත්ව ගිය නිලධාරීන් 07 දෙනෙකු අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණයක් මත ඔවුන් දැරූ තනතුරු සඳහාම කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. සහකාර සාමාන්‍යාධිකාරිවරු තිදෙනෙක්, ඉංජිනේරුවරයෙකු, මූල්‍ය කළමනාකරු සහ සැපයුම් කළමනාකරු යන නිලධාරීන් ඔවුන් ලබාගත් වැටුපම ගෙවීමේ පදනම මත මෙලෙස තව දුරටත් සමාගමේ සේවයේ යොදවා තිබූ නමුත් ඔවුන්ගේ පත්කිරීමේ කොන්දේසි ඇතුළත් පත් කිරීමේ ලිපි රාජකාරී ලැයිස්තු, සේවයට වාර්තා කිරීමේ ලේඛනයන් හා කල වැඩ වාර්තාවන් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. කෙසේ නමුත් එම නිලධාරීන් 2018 පෙබරවාරි සිට සැප්තැම්බර් දක්වා රු. 8,840,669 ක් වැටුප් හා දීමනා ලෙස ලබාගෙන තිබුණි.

තවද කම්කරු දෙපාර්තමේන්තුවේ කොළඹ කාර්මික අධිකරණයේ කාර්මික බේරුම්කරණ අංක A/37/2017 හා 2018 පෙබරවාරි 02 දින පර්ශවකරුවන් අතර ඇති කර ගන්නා ලද සමථ ගිවිසුමෙහි කොන්දේසි අංක 18 (අ) වගන්තියේ සඳහන් පරිදි මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ අදාල කිසිදු සේවකයෙකුට වැටුප හෝ ඊට හිලවු වශයෙන් කිසිදු ගෙවීමක් 2018 ජනවාරි 31 දිනෙන් පසුව සිදු නොකරන බවට පාර්ශවකරුවෝ එකග වී තිබුණි.

(ආ) සමාගම විසින් නිලධාරීන් සේවය අවසන් කිරීම සඳහා වන්දි ගෙවීමේදී රු.411,585 ක් වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 2017 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව නීති වියදම් රු.3,712,245 ක් විය. මෙම වියදම් තුළ මාගම්පුර වරාය කළමනාකරණ සමාගමේ නීතීඥවරයෙකු ලෙස කටයුතු කළ මව් සමාගම වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වෙත ගෙවන ලද රු. 725,000 ක් ද ඇතුළත්ව තිබුණි. කෙසේ වුවද මාගම්පුර වරාය කළමනාකරණ සමාගම විසින් නීතීඥවරයෙකු ලෙස ඉහත නිලධාරියා පත්කළ ආකාරය හා ගෙවීම් කොන්දේසි, කාර්යභාරය සහ අනුමැතිය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(ඇ) මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම් සේවකයන් වන්දි ගෙවා ඉවත් කිරීමේදී ඇති වූ ආරාවුල් සහගත තත්ත්වය කම්කරු දෙපාර්තමේන්තුවේ කොළඹ කාර්මික අධිකරණයේ කාර්මික බේරුම්කරණ අංක A/37/2017 සහ 2018 පෙබරවාරි 02 දින පාර්ශවකරුවන් අතර ඇති කර ගන්නා ලද සමථ කොන්දේසිවලට එළඹීම මත අවසන් කර තිබුණි. සමථ ගිවිසුමේ කොන්දේසි අංක 18 (ආ) අනුව 2017 නොවැම්බර් මාසය සඳහා හිඟ අතිකාල දීමනා සහ/හෝ 2018 ජනවාරි දක්වා හිඟ වැටුප් ගෙවිය යුතුව ඇත්නම්, එම ගෙවීම් 2018 පෙබරවාරි 28 වන දිනට පෙර ගෙවා නිම කළ යුතු බවට එකඟ වී තිබුණි. නමුත් මාගම්පුර වරාය කළමනාකරණ සමාගම විසින් එම එකග වූ කොන්දේසිවලට පටහැනිව සමාගමේ මෙහෙයුම් අක්‍රියව පැවතීම නිසා ගෙවීමට හිමිකමක් නොමැති වූ 2017 දෙසැම්බර් සහ 2018 ජනවාරි මාස වලට අදාලව කාර්යසාධන දීමනා, වාහන දීමනා, නවාතැන් දීමනා හා ගමන් වියදම් දීමනා ලෙස රු. 12,211,073 ක් ගෙවා තිබුණි.

## 4.5 නොවිසඳී ඇති විගණන ඡේද

මාගම්පුර වරාය කළමනාකරණ සමාගමේ සංවිධාන සටහන (සේවක සංඛ්‍යාව) තුල ඇතුලත් නොවූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තෙල් ගුදම් කටයුතු) තනතුර සඳහා නිලධාරියෙකු 2013 දෙසැම්බර් 02 දින සිට බඳවාගෙන තිබුණි. නැව් තෙල් මෙහෙයුම් කටයුතු විධිමත් කිරීම සඳහා මෙම නිලධාරීයා බඳවාගෙන තිබුණ ද එම කාලයේදී නැව් තෙල් මෙහෙයුම් කටයුතුවලින් සමාගමට රු. 1,876,555,819 ක් පාඩු සිදු වී තිබුණි. මේ නිසා මෙම නිලධාරියා සේවයේ යොදවා ගන්නා ලද 2013 දෙසැම්බර් සිට 2016 ජනවාරි කාලය තුල ගෙවන ලද වැටුප් හා දීමනා, ඉන්ධන හා අධිවේගී මාර්ග ගාස්තු රු. 20,826,983 ක් අනාර්ථික වියදම් බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ (i) 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගමේ 2017 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් දින 210 ක ප්‍රමාදයකින් පසුව 2018 සැප්තැම්බර් 28 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

**----------------------------**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | **<u>පද්ධති හා පාලන ක්ෂේත්‍රය</u>** | **<u>නිරීක්ෂණ</u>** |
|---|---|---|
| (අ) | තොග පාලනය | භාවිතයට ගත නොහැකි තොග ඉවත් කිරීමට ක්‍රියා නොකිරීම. |
| (ආ) | ලැබිය යුතු ශේෂ | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට ක්‍රියා නොකිරීම. |